රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2017

මගේ අංකය : F/FR/**03**/BRCir.
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
**2017.06.** 01

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරු,

**රජයේ ගොඩනැගිලි කුලී "20.02.01.01" සඳහා ආදායම් ඇස්තමේන්තු - 2018**

රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් ඇතුළත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2015 හා 2015.07.20 චක්‍රලේඛය පිළිබඳව ඔබගේ අවධානය යොමු කරවමි.

02. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක FP/06/100/05/01/(iv) හා **2014.10.29** දිනැති ලිපියට අනුව 2015.01.01 දින සිට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරනු ලබන ආදායම් සංකේතාංක **"20.02.01.01"** වන රජයේ ගොඩනැගිලි කුලී ආදායම් එකතු කිරීමේ වගකීම පැවරී ඇති ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් / ගණන්දීමේ නිලධාරීන් විසින් එකතු කිරීමට අපේක්ෂිත ආදායම් පිළිබඳ ඇස්තමේන්තු මු.රෙ. 85(1), (2) ප්‍රකාරව හැකිතාක් තාත්විකව හා නිවැරදිව සකස් කර "buildingrentpubad@gmail.com" යන විද්‍යුත් ලිපිනයට මෘදු පිටපතක්ද සහිතව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ "ප්‍රධාන මූල්‍ය නිලධාරී" වෙත ඉදිරිපත් කළ යුතු වේ.

03. ඒ අනුව, **20.02.01.01** රජයේ ගොඩනැගිලි කුලී ආදායම් සංකේතාංක යටතේ 2018 වර්ෂය සඳහා ඔබ කාර්යාලය මගින් එකතු කිරීමට අපේක්ෂිත ආදායම් පිළිබඳව ඇස්තමේන්තු මේ සමග අමුණා ඇති ආකෘතියට අනුව සකස්කර 2017.06.22 දින හෝ ඊට පෙර මෙම අමාත්‍යාංශය වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය

පිටපත් :- 1. විගණකාධිපති
2. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්

(ආකෘති පත්‍ර අංක. 1)

# වසර 2018 සඳහා ආදායම් ඇස්තමේන්තු

(i) ව්‍යවස්ථාව/ අධිකාරිය : ආයතන සංග්‍රහය / ඉඩම් සංවර්ධන ආඥා පණත / රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2017

(ii) ව්‍යවස්ථාපිත අධිකාරිය:- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

(iii) ආදායම් අයිතමය :- රජයේ ගොඩනැගිලි කුලී

(iv) ආදායම් සංකේතාංකය :- 20.02.01.01

| විස්තරය | ආදායම 2016 රු.මිලියන | ඇස්තමේන්තු ආදායම 2017 වර්ෂය | | | වසර 2018 සඳහා ඇස්තමේන්තු කළ ආදායම රු.මිලියන | පුරෝකථන | | 3 වන සහ 4 වන තීරු අතර වෙනස පිළිබඳව හේතු | 4 සහ 6 වන තීරු අතර වෙනස (වැඩිවීම හෝ අඩුවීමට හේතු) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූලික ඇස්තමේන්තුව රු.මිලියන | සංශෝධිත ඇස්තමේන්තුව රු.මිලියන | 2017.05.31 දිනට සත්‍ය ආදායම රු.මිලියන | | 2019 රු.මිලියන | 2020 රු.මිලියන | | |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) |
| 01. නිල නිවාස<br>02. සංචාරක බංගලා / නිවාඩු නිකේතන<br>03. වෙනත් ගොඩනැගිලි කුලී | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

(9 හා 10 තීරු සඳහා වලංගු හේතූන් අනිවාර්යයෙන්ම සඳහන් කල යුතුය. )

නිවැරදි බවට සහතික කරමි

………………………………………………………

දිනය:-

ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා / දිස්ත්‍රික් ලේකම්
( නිල මුද්‍රාව )